අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/6/5

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.09. 19.

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මහත්ම මහත්මීන් මගින්,
සියලුම චිත්‍ර කලා විෂයභාර නිලධාරීන් සහ ගුරු උපදේශක මහත්ම මහත්මීන් වෙත,

**ලෝක ළමා දින සැමරුම 2023.10.01.**
**"සිරස" මාධ්‍ය ජාලය මගින් පවත්වනු ලබන චිත්‍ර තරඟය හා ප්‍රදර්ශනය.**

සිරස මාධ්‍ය ජාලය මගින් පැවැත්වීමට නියමිත උක්ත වැඩසටහන සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙහි සහාය ලබා දෙන ලෙස, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

02. ඒ අනුව, මේ හා සම්බන්ධයෙන් සියලුම පාසල්හි අදාළ සිසුන් හා ගුරුභවතුන් මෙන්ම විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට විෂයභාර නිලධාරීන් දැනුවත් කරන මෙන්, අතිරේක ලේකම්තුමිය (පාසල් කටයුතු) විසින් 2023.09.19 වන දින සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව වෙත දන්වන ලදි.

03. චිත්‍ර ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරනු මැනවි.

- තේමාව - "සියල්ලටම වඩා ළමයින් වටී"
- වයස් කාණ්ඩ - 4,5 ශ්‍රේණි/ 6,7,8 ශ්‍රේණි/ 9,10,11 ශ්‍රේණි /12,13 ශ්‍රේණි (කාණ්ඩ 04කි)
- මාධ්‍යය - ඔබ කැමති මාධ්‍යයකින් චිත්‍රය ඇඳ එහි ජායාරූපයක් සහ එම චිත්‍රයේ පිටුපස දරුවගේම නිර්මාණයක් බවට විදුහල්පති සහතික කර එහි ජයා රූපයක් ද, 0765997788 දුරකථන අංකය (සිරස මාධ්‍ය ජාලය) වෙත Whatsapp මගින් යොමු කරන්න.
- චිත්‍ර කඩදාසියේ ප්‍රමාණය - A3

04. මෙම චිත්‍ර තරඟය පිළිබඳව සිරස මාධ්‍ය ජාලය විසින් ද ප්‍රජාව දැනුවත් කිරීම සිදු කර ඇති බව අප වෙත දන්වා ඇත. අදාළ චිත්‍ර යොමු කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් වැඩිදුරටත් දැනුවත් වීම සඳහා සිරස මාධ්‍ය ජලයේ පහත සඳහන් නිලධාරියා සම්බන්ධීකරණය කිරීමට අදාළ පාසල් දැනුවත් කරනු මැනවි.

- කළමනාකරු (අලෙවි) - සම්පත් අත්තනායක - 0713056222

05. මෙම ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවියේ විශේෂ දැන්වීම් තීරුවේ ද පළකර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මේ සම්බන්ධයෙන් ඔබ විසින් කඩිනමින් පියවර ගැනීම ඉතා අගයකොට සලකමි.

ආචාර්ය නිශාද් හඳුන්පතිරණ
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත් :-

01. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මහත්ම මහත්මීන් - කරු. දැ. ගැ. ස.
02. පළාත් සෞන්දර්ය විෂයභාර මහත්ම මහත්මීන් - කරු. අ. ක. ස.
03. කළමනාකරු (අලෙවි) - සිරස මාධ්‍ය ජාලය - කරු. අ. ක. ස.
04. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) - කරු. දැ. ගැ. ස.
05. අතිරේක ලේකම් (පාසල් කටයුතු) - කරු. දැ. ගැ. ස.



Scanned with CamScanner